# ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. තාක්ෂණ නිලධාරී ICT (කොන්ත්‍රාත් පදනම මත)

**අවශ්‍ය සුදුසුකම් :**

1. අ. පො. ස උසස් පෙළ විභාගය ඕනෑම විෂය ධාරාවකින් විෂයන් 03 කින් එකවර සමත් වී තිබිය යුතුවේ.

සහ

2. තොරතුරු සන්නිවේදන සහ බහුමාධ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ පිළිගත් ආයතනයක් විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/ තොරතුරු තාක්ෂණය හෝ ඊට සමාන අංශයකින් N.V.Q මට්ටම 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

➢ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සේවා පළපුරුද්ද ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

❖ ඉහත සඳහන් කළ සුදුසුකම්වලට අමතරව අයදුම්කරුවන් පහත සඳහන් පශ්චාත් නිශ්චිත සුදුසුකම් ලබා තිබිය යුතුය.

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අයදුම් කිරීමේ අවසන් දිනයට වයස අවුරුදු 18ත් 45ත් අතර විය යුතුය.
- හොඳ චරිතයක් විය යුතුය.

වැටුප **:** රු 31,625 + රු17,800 (ජීවන වියදම් දීමනාව ) + රු.5,000 ( විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2022 අනුව රජයේ අනුමත දීමනාව )

(මීට අමතරව සේවක භාරකාර අරමුදල හා සේවක අර්ථසාධක අරමුදල සඳහා විශ්වවිද්‍යාලය මඟින් දායක මුදල ගෙවීම හා සේවකයා මඟින් දායක මුදල ගෙවීම අදාළ වේ.)

## 2. ආරක්ෂක පරීක්ෂක (කොන්ත්‍රාත් පදනම)

**අවශ්‍ය සුදුසුකම් :**

1. a). අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කින් සමත් වීම සහ සිංහල භාෂාව / දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ ගණිතය යන විෂයන් ඇතුලුව සම්මාන සාමාර්ථ 05 ක් තිබිය යුතුවේ.

**හෝ**

b).අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය තෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව / දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ ගණිතය විෂයන් ඇතුලුව විෂයන් 06 කින් සමත් වීම සහ විශ්වවිද්‍යාල පද්ධතියේ ආරක්ෂක සේවයේ වසර පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

සහ

2. පොලිස් හෝ හමුදා සේවයේ හෝ විශ්වවිද්‍යාල පද්ධතියේ ආරක්ෂක සේවයේ හෝ පිළිගත් ආරක්ෂක සේවයක අවම වශයෙන් වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

3. ක්‍රීඩා කටයුතුවල ක්‍රියාකාරීව සහභාගී වී තිබිය යුතුය.
4. උස - අඩි 5 අඟල් 4 නොඅඩු විය යුතුය.
5. පපුව - අඟල් 34 ට නොඅඩු විය යුතුය.
6. අයදුම් කිරීමේ අවසන් දිනයට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප : රු. 30,725 + රු17,800 (ජීවන වියදම් දීමනාව ) + රු.5,000 ( විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2022 අනුව රජයේ අනුමත දීමනාව )

(මීට අමතරව සේවක භාරකාර අරමුදල හා සේවක අර්ථසාධක අරමුදල සඳහා විශ්වවිද්‍යාලය මගින් දායක මුදල ගෙවීම හා සේවකයා මගින් දායක මුදල ගෙවීම අදාළ වේ.)

## 03. ආරක්ෂක නිලධාරි (කොන්ත්‍රාත් පදනම)

**අවශ්‍ය සුදුසුකම් :**

1. අටවන ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය.
2. ක්‍රීඩා සහ ප්‍රජා කටයුතු සඳහා ක්‍රියාකාරී සහභාගීත්වය.
3. උස - අඩි 5 අඟල් 6 ට නොඅඩු විය යුතුය.
4. පපුව - අඟල් 32 ට නොඅඩු විය යුතුය.
5. අයදුම් කිරීමේ අවසන් දිනයට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

වැටුප : රු. 27,025 + රු17,800 (ජීවන වියදම් දීමනාව ) + රු.5,000 ( විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2022 අනුව රජයේ අනුමත දීමනාව )

(මීට අමතරව සේවක භාරකාර අරමුදල හා සේවක අර්ථසාධක අරමුදල සඳහා විශ්වවිද්‍යාලය මගින් දායක මුදල ගෙවීම හා සේවකයා මගින් දායක මුදල ගෙවීම අදාළ වේ.)

**ඉහත තනතුරු සඳහා බඳවා ගැනීමට අදාළ සෙසු කරුණු:-**

- අයදුම් කරන තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු වලට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කෙරේ.

- කොන්ත්‍රාත් කාලය මාස 06ක් වන අතර සේවා ඵලදායීතාවය හා විශ්වවිද්‍යාලයීය පාලක සභාවේ තීරණය මත කොන්ත්‍රාත් කාලය තවදුරටත් දීර්ඝ කරනු ලැබිය හැක. එසේ දීර්ඝ කිරීම හෝ දීර්ඝ නොකිරීම සම්බන්ධව සම්පූර්ණ බලතල විශ්වවිද්‍යාලයීය පාලක සභාව සතුවේ.

**අයදුම්පත් යොමු කිරීම**

- ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියෙන් බාගත කරන ලද අයදුම්පත් නිසිපරිදි සම්පූර්ණ කර අධ්‍යාපනික සහ සෙසු සහතික වල සහතික කරන ලද පිටපත් ද සමඟ , **2025 පෙබරවාරි 24** වන දින ප.ව. **3.00** ට පෙර ලැබෙන පරිදි **" සහකාර ලේඛකාධිකාරී, ආයතන අනධ්‍යයන අංශය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, නුවර පාර, යක්කල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ ගෙනවිත් භාරදීම කළ යුතුවේ.

- අයදුම්කරන තනතුර , අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුවේ.

- අයදුම්පත් භාර ගන්නා අවසාන දින ඉහත සඳහන් වේලාවට පසුව ලැබෙන අයදුම්පත් හා නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරී**
**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය**